ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

# ප්‍රසම්පාදන දැන්වීමයි

## වෙබ් යෙදුම් ෆයර්වෝල් (Web Application Firewall -WAF) පද්ධතියක් සැපයීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම

## PR/02/12-47

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (SLBFE) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින්, "වෙබ් යෙදුම් ෆයර්වෝල්" (WAF) සැපයීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ.

මෙම ලංසු තැබීම ජාතික තරඟකාරී ලංසු තැබීමේ (NCB) ක්‍රියා පටිපාටිය යටතේ සිදු කරනු ලබන අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (GOSL) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල අර්ථ දක්වා ඇති සහ ලංසු ලේඛනවල සඳහන් සුදුසුකම් සපුරාලන සියලුම සුදුසුකම් ලත් ලංසුකරුවන් සඳහා මෙම ලංසුකරණය විවෘත වේ.

ලංසු ලේඛන, 2026.07.17 දින සිට 2026.08.07 දින දක්වා රජයේ වැඩකරන දිනවල කාර්යාල වේලාවන් තුළ ඉහත ලිපිනයෙන් නොමිලේ පරීක්ෂා කළ හැකිය.

මේ පිළිබඳ වැඩිදුර තොරතුරු: ප්‍රසම්පාදන කළමනාකාර, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, 2 වන මහල, අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ලිපිනයෙන් ලබාගත හැක. (දුරකථන: 011-2880550, විද්‍යුත් තැපැල: mgr_procurement@slbfe.lk).

රුපියල් 5,000.00 ක ආපසු නොගෙවන ගාස්තුවක් මුදල් අයකැමි වෙත ගෙවීමෙන් අනතුරුව ලංසුකරුවන්ගේ නිල ලිපි ශීර්ෂය මත කරන ලද ලිඛිත ඉල්ලීමක් සමඟ ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කිරීමෙන්, 2026.07.17 සිට 2026.08.07 දක්වා පෙ.ව. 9.00 ත් ප.ව. 3.00 ත් අතර කාලය තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රසම්පාදන අංශයෙන් ලංසු ලේඛන ලබා ගත හැකිය.

ලංසුකරුවන් ලංසුව විවෘත කරන දින සිට දින 105 ක කාලයක් (2026.08.10 – 2026.11.25) වලංගු වන රුපියල් 130,000.00 ක වටිනාකමකින් යුත් ලංසු ඇපකරයක් ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතු අතර, එය ලංසු ලේඛනයට අමුණා තිබිය යුතුය.

තෝරාගනු ලබන ලංසුකරු / ලංසුකරුවන්, ලංසුව පිළිගැනීමේ ලිපිය නිකුත් කළ දින සිට දින 14 ක් ඇතුළත මුළු ලංසු වටිනාකමෙන් 10% කට සමාන කාර්ය සාධන ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. එය පිළිගැනීමේ ලිපිය නිකුත් කළ දින සිට දින 393 ක කාලයක් සඳහා වලංගු විය යුතුය. ටෙන්ඩරය පිරිනැමීමෙන් පසු සාර්ථක ලංසුකරු අදාළ සේවාව සැපයීමට අපොහොසත් වුවහොත්, පූර්ව දැනුම්දීමකින් තොරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අදාළ කාර්ය සාධන ඇපකරය සම්පූර්ණයෙන්ම මුදල් කර ගනු ලැබේ.

ලංසු ඇපකරය සහ කාර්ය සාධන ඇපකරය ආපසු හැරවිය නොහැකි, කොන්දේසි විරහිත සහ ඉල්ලුම් කළ සැනින් ගෙවිය හැකි බැංකු ඇපකර ආකාරයෙන් ඉදිරිපත් කළ යුතුය. එම ඇපකර ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් නිකුත් කර තිබිය යුතු අතර, කිසිදු පැකිලීමකින්, සීමාකිරීමකින් හෝ විරෝධතාවයකින් තොරව පළමු ලිඛිත ඉල්ලීම මතම "ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති" වෙත ගෙවිය හැකි විය යුතුය.

ලංසු අඩංගු මුද්‍ර, තැබූ කවරයේ ඉහළ වම් කෙළවරේ "**Supply, Installation, Commissioning & Maintenance of a Web Application Firewall (WAF) – PR/02/12-47**" ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය.

ලංසු, 2026.08.10 දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2 වන මහලේ, ප්‍රසම්පාදන අංශයේ තබා ඇති අංක 01 ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය . ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම එම ස්ථානයේදීම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගී විය හැකිය.

කිසිදු හේතු දැක්වීමකින් තොරව ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, ලංසු ලේඛන සැකසීමට හෝ ඉදිරිපත් කිරීමට සෘජුව හෝ වක්‍රව දැරූ කිසිදු වියදමක් පියවීමට කාර්යාංශය බැඳී නොසිටී.


**සභාපති**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,**
**අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල.**
**දුරකථන / ෆැක්ස් : 011-2880550 / 2880564 / 2887585**
**විද්‍යුත් තැපෑල : mgr_procurement@slbfe.lk**


SLSI SYSTEM CERTIFIED ISO 9001

**"එතෙර සවියට මෙතෙර අත්වැල"**